# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය

# ළමා සේවා ක්ෂේත්‍රය



කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්*

## පෙළගැස්ම

| | සම්මාන |
|---|---|
| අනිවාර්ය<br>බයිබලය සහ දේවධර්ම පාඨමාලා<br>ළමා සේවා පාඨමාලා | <br>08<br>08 |
| වෛකල්පික පාඨමාලා | 20 |
| එකතුව | 36 |

## අනිවාර්ය: බයිබලය සහ දේවධර්ම පාඨමාලා

දරු දැරියන් පිළිබඳව බයිබලීය දැක්ම
දේවධර්මයට හැඳින්වීම
නව ගිවිසුමට හැඳින්වීමක්
ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

## අනිවාර්ය: ළමා සේවා පාඨමාලා

සාකල්‍ය ළමා සංවර්ධනය
දරු දැරියන්ට බයිබලය ඉගැන්වීම
ළමා සේවයේ ආචාරධර්ම
ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

## වෛකල්පික පාඨමාලා

අපයෝජනයට ලක් වූ දරුවන් වෙත සේවය
අවදානම් සහිත දරුවන් කෙරෙහි සභාවේ භූමිකාව
ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම
සංස්කෘතිය අවබෝධ කරගැනීම
කිතුනු දෙමාපියභාවය
යෞවන යෞවනියන් සඳහා සේවය
ළමා උපදේශනය
දරු දැරියන් සඳහා ශ්‍රාවකත්වය
කිතුනු දැක්ම තුළ සන්නිවේදනය
රැකවරණය සලසන්නාගේ ආත්මික හැඩගැස්ම සහ
ආතතිය කළමනාකරණය

පාඨමාලා විස්තර සඳහා ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය:
ළමා සේවා ක්ෂේත්‍රය පාඨමාලා නාමාවලිය බලන්න

## පාඨමාලාව

- පන්ති කාලය පැය 3 බැගින් සතියකට දෙවරක් පැවැත්වේ.
- සෑම පාඨමාලාවක් සඳහා සම්මාන 2කි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

## පාඨමාලා දේශන පැවැත්වීම

**අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවයක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

## වැඩමුළු

විෂය අනුබද්ධිත පාඨමාලාවට අමතරව අන්තර්ජාලය හරහා කාලෝචිත මාතෘකාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වනු ලැබේ.

## පාඨමාලා ගාස්තු

පාඨමාලා ගාස්තු පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය අමතන්න.

## විෂයමාලාවට අයදුම් කිරීමේ ක්‍රියාවලිය

අවම අවශ්‍යතාව: අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ළමා සේවාවන්හි පළපුරුද්ද සළකා බලනු ලැබේ

**ලිපිලේඛන**

- සභාපාලකතුමා විසින් සම්පූර්ණ කළයුතු නිර්දේශ පත්‍රය
- නිර්දේශිත ලිපිය
- ඡායාරූප 3ක්
- අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතික පත්‍රය

**පියවර 1**

**විෂයමාලා අයදුම්පත:** ලියාපදිංචි වීමේ අයදුම්පත් සම්බන්ධීකාරක වෙතින් ලබාගන්න. අයදුම්පත සම්පූර්ණයෙන්ම පූරවා සියලු ලිපි ලේඛන සමග සම්බන්ධීකාරකට භාරදෙන්න.

**පියවර 2**

**පිළිගැනීම:** ළමා සේවා ක්ෂේත්‍රයේ ක්‍රිස්තියානි අධ්‍යාපනික සහතික පත්‍ර පාඨමාලාව සඳහා ඔබගේ අයදුම් පත්‍රය පිළිගත් බව ලිඛිතව දැනුම්දෙනු ලැබේ.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව "ශ්‍රී ලංකා ළමා ධර්මදාන සහභාගිත්වයේ" (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවය කර ඇත.



**චමිලා සුභාස් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිනියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමනාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනී සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**තුසිත එදිරිසිංහ,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්වය පිළිබඳ උපාධි විද්‍යාලයේ (IGSL) නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ළමා ධර්මදාන සේවා සහභාගීත්වයෙහි (Child Evangelism Fellowship) අවුරුදු 10 කට වැඩි කාලයක් සේවය කළ අතර කල්එළියේ මෙතෝදිස්ත දූතන සේවා දේවධර්ම විද්‍යාලයෙහි විදුහල්පති ලෙස සේවය කළේය. භාෂා පරිවර්තකයෙකි. අවුරුදු 25ක් පුරා සබත් පාසල් ගුරුවරයෙකි. ලක්ෂපතිය මොරටුවේ පිහිටි ලංකා සභාවේ ශු.මත්තියස්ගේ දේවස්ථානයේ සාමාජිකයෙකි. වර්තමානයේදී අන්තර් නිකායික සාකල්‍ය පවුල් සේවා මෙහෙවරක යෙදී සිටියි.




**දිලිප් ගුණවීර,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. එසේම කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ රජරට දුරස්ථ අධ්‍යාපන පීඨයේ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කරයි. වසර 13 ක කාලයක් කල්වාරි දේවස්ථානයේ සභාපාලක සේවයේ අත්දැකීම් ඇත. වර්තමානයේ අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.



**රවීන් කල්දේරා,** DipAgri, BTh, BA , MA
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දායකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**මනෝජ් පීරිස්,** BTh, LDD, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. මීගමුව ප්‍රදේශයේ පැල්පත්වාසී ජනතාව සමඟ සේවය කරන අතර Friends In Christ ගෝලත්ව සේවයෙහි පුරෝගාමී හා මිත්‍රෝපදේශක ලෙස කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ තරුණ සේවය භාර පාලකවරයා ලෙස ද ලංකා ප්‍රේස්බිටේරියානු තරුණ ලීගයේ සම-සාමාජික (Co-Opt Member) ලෙස ද වගකීම් දරයි. සිංගප්පූරුව කවනන්ට් ප්‍රේස්බිටේරියානු සභාවේ ශ්‍රී ලාංකීය සේවයෙහි ලාංකීය කලාපය භාර සභාපාලකවරයෙක් ලෙස ද කටයුතු කරයි.



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමඟ සංවිධානයේ හි (YFC) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදාරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.

## ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
## ළමා සේවා ක්ෂේත්‍රය

"අප අද දින දරුවන් නොසලකන්නේ නම්,
අපට ඇති පිබිදීම
මෙම පරම්පරාවට පමණක් සීමාවනු ඇත."
(ජෝන් වෙස්ලි)

තම මානසික, ශාරීරික, සාමාජීය හා ආත්මික අවශ්‍යතා පිළිබඳ අවදිමත් බවින් යුතුව, සවිමත් දේව සබඳතාවයක් කරා දේව වචනය ඉගෙනීමෙහි වර්ධනයවෙමින්, දරුවෙකු හෝ දැරියකගේ ලෝකදෘෂ්ටිය, සංවර්ධනය සහ අභිමිතාවයන් වටහාගෙන ඔහුට හෝ ඇයටද එම පවුලටද ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීමෙන් උපස්ථානය සැලසීම පිණිස අවශ්‍ය කුසලතා හා සම්පත්වලින් සිසු-සිසුවියන් බලගැන්වීම.

## ළමා සේවා ක්ෂේත්‍රයෙහි ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය තුළින් බලගන්වනු ලබන ප්‍රධාන අංශ:

### දැනුම: පහත කරුණු පිළිබඳ දැනුවත්බව

- කිතුනු ළමා සේවය සඳහා බයිබලීය පදනමින් යුතු දේවධර්මීය හා ආචාරධර්මීය දැනුම
- දරුවාගේ සාකල්‍ය සංවර්ධනය සහ වර්ධනයට සමගාමී ලෝකදෘෂ්ටිය පිළිබඳ වටහාගැනීම
- දරුවෙකු ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලත්වයට ගෙනෙන පිණිස අවශ්‍ය කිතුනු වගකීම හා යුතුකම කෙරෙහි අවබෝධය

### පෞද්ගලික සංවර්ධනය: මෙම අංශයන් වලින්

- ඔබගේ කැඳවීමට අනුකූලව ආත්මික විනය හා හැඩගැස්ම වර්ධනය කරගැනීම
- දරු-දැරියන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් සහකම්පිත හදවතක් වර්ධනය කරගැනීම
- දරු-දැරියන්ගේ සමාජ සාධාරණත්ව ගැටලු වෙනුවෙන් හඬක් නඟන ධෛර්ය ලබාගැනීම

### යෙදවුම: ඔබ බලසතු වන්නේ

- දරු-දැරියන්ට දෙවි වදන උගන්වමින් දේව සබඳතාවය තුළ ගෝලත්වයට යොමුකරවීමට
- දරු-දැරියන්ට ඵලදායී ලෙස මිත්‍රෝපදේශනය සලසන්නන් බලගැන්වීමට
- අද දරුවා එදිනෙදා මුහුණදෙන විවිධ ගැටලුවලින් මුදවාගන්නට සහ අවශ්‍යතාවයන්ට සරිලන පියවර සඳහා යොමුවීම

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්

දේව වචනයෙහි මුල් බැස ගත්
සේවය කිරීමට දක්ෂ
සභාවට කැපවී ඇති

## ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
## ළමා සේවා ක්ෂේත්‍රයෙහි
## විශේෂ ලක්ෂණ

අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි.

සියලුම පාඨමාලා අන්තර්ජාලය හරහා සිදුවේ.

කාලෝචිත වැඩමුළු 4කි.

විෂයමාලාව වසර 2 කින් නිම වේ.

පෙර දේවධර්ම පුහුණුව අවශ්‍ය නොවේ.

වැඩි විස්තර සඳහා විමසන්න

සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය

189 දුටුගැමුණු වීදිය, කොහුවල
011 2890809 | 076 4823127 |
cm@cts.lk | www.cts.lk